කුලියාපිටිය ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

## 01. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 19 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂයේ සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුව ඇස්තමේන්තුවල වෙනස්වීම් ඊට අදාල ආදායම්/ වියදම්වල ප්‍රවර්තන වර්ෂයේ වෙනස්වීම් ලෙස හඳුනාගත යුතු වුවද, ඉකුත් වර්ෂයේ උසාවි දඩ මුදල් රු.827,499 ක් හා මුද්දර ගාස්තු රු.32,834,885 ක් වැඩියෙන් ඇස්තමේන්තු කිරීම් ඉකුත් වර්ෂ වෙනස්කම් ලෙස හඳුනාගෙන තිබුණි. | ඇස්තමේන්තු වෙනස්වීම් ප්‍රවර්ථන වර්ෂ ආදායම් වියදම්වලට සලකා බැලිය යුතු වේ. | පෙර වර්ෂවල ගිණුම් සකස් කිරීමේ දී ගැලපුම්කළ ආකාරයට 2019 වර්ෂයේ ද පෙර වර්ෂය සඳහා ගැලපීම් සමුච්චිත අරමුදල හරහා සිදුකළ අතර 2020 වර්ෂයේ දී ගිණුම් සකස්කිරීමේ දී ප්‍රවර්තන වර්ෂයට ගැලපීම් සිදුකිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ සංවර්ධනය කරනු ලැබූ ගොඩනැගිලි 06 ක රු.4,909,127 ක නිමි වැඩ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | වැඩ නිමකිරීමෙන් පසු ඉදිකිරීම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු වේ. | එකඟ වේ.2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල මිලදීගනු ලැබූ එකතුව රු.1,583,176 ක් වටිනා විවිධ වත්කම් විෂයන්ට අදාල අයිතම 328 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දිනට පැවැති වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව වෙන්දේසි කළ අයිතමයන් 44ක පිරිවැය මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි. | වෙන්දේසි කිරීමට හඳුනාගත් භාණ්ඩවල පිරිවැය ගිණුම්වලින් ඉවත්කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම් සකස්කිරීමේදී ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති හිස්තාර බැරල් 1,107 ක ශුද්ධ උපලබ්ධි අගය වන රු.110,700 ක් තොග ගිණුම්ගත කර නොතිබුණි. | තොග ගිණුම්ගත කළ යුතු වේ. | තොරතුරු නොලැබීම මත ගිණුම්ගත නොකළ අතර 2020 වර්ෂයේ දී ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | ප්‍රාදේශීය සභා භූමියේ ඉදිකර තිබූ වොලිබෝල් ක්‍රීඩාපිටියේ කළ වැඩ වටිනාකම රු.1,555,008 ක් ගිණුම්ගත කර නොතිබුණි. | සියළු වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | එකඟ වේ. 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (උ) | ප්‍රාදේශීය සභා භූමියේ ආපනශාලාවේ කළවැඩ වටිනාකම රු.2,160,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | සියළු වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | එකඟ වේ. 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | ඉඩම් වෙන්දේසි වලින් සභාවට ලැබී තිබූ අක්කර 01 පර්චස් 27.72 ක් විශාල වූ ඉඩම් කොටස් 04 ක් ගිණුම්ගත කර නොතිබුණි. | සියළු වත්කම් නිවැරදිව ගිණුම්වලට ගැළපිය යුතු වේ. | මෙම ඉඩම්වලට අදාලව ඔප්පු ලැබී නොතිබුණ අතර 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (එ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවතුණු ගිණුම් විෂයන් 05 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපයෝගී පොත් අනුව ශේෂ අතර රු.37,504,441 ක නොසැසඳීම් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. | **යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ**<br>උපලේඛනය හා මූල්‍ය ප්‍රකාශනය අනුව රු. 829798.28 ක වෙනසක් පවතී.<br><br>**මෝටර් රථ හා කරත්ත**<br>වසර කිහිපයක සිට පැවත එන වෙනසකි.<br><br>**ලීබඩු හා සවිකිරීම්**<br>2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.<br><br>**විවිධ ණයහිමි**<br>ණයහිමි උපලේඛනය හා මූල්‍ය ප්‍රකාශන වටිනාකම අතර වෙනස සොයාබලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඒ) | වටිනාකම රු.401,367,671 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළව විස්තරාත්මකව උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. | 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී විස්තරාත්මක උපලේඛන ලබාගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) පළාත් අමාත්‍ය මණ්ඩල තීරණ | | | | |
| 2014 අප්‍රේල් 01 දිනැති වයඹ පළාත් අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණ අංක 6/1/අමා/2014/37 | 130,689 | සභාපති සහ උප සභාපති සඳහා 2019 වර්ෂයේ රු.36,000 හා රු.72,000 ක සන්නිවේදන දීමනාවක් ද දුරකථන බිල්පත් පියවීම වෙනුවෙන් පිළිවෙලින් රු.35,915 ක් හා රු.22,774 ක් ද ගෙවා තිබුණි. | සන්නිවේදන දීමනා ගෙවනු ලබන්නේ දුරකථන හා අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් බැවින් එකම වියදමක් වෙනුවෙන් දීමනාවක් හා ප්‍රතිපූර්ණයක් සිදුකළ නොහැකි බැවින් පළාත් පාලන කොමසාරිස්ගෙන් විමසීම් කර නිශ්වය කර ගත යුතු වේ. | වයඹ පළාතේ සියලුම පළාත් පාලන ආයතනවල සභිකයින් සන්නිවේදන දීමනාවක් වශයෙන් රු.3,000 ක් ගෙවීමට ලබාදී තිබූ අනුමැතිය මත සභාපති/ උප සභාපති සඳහා 2019 වර්ෂයේ රු.72,000 ක සන්නිවේදන දීමනාව ගෙවනු ලැබීය. එය සියලුම සභිකයින්ට හිමිවන බව සඳහන් වේ.<br>ඊට අමතරව 2008 වර්ෂයේ සිටම පලාත් පාලන ආයතනයේ සභාපති හා උප සභාපති වෙත මසකට රු. 3,000 හා රු.4,500 උපරිමයකට යටත්ව දුරකථන දීමනාවක් හිමි වී ඇත. එය අවලංගු වන බවක් ඉහත ගැසට් නිවේදනයේ දී සඳහන්ව නොමැති අතර මෙතෙක් එම දීමනාව සභාපති / උපසභාපති වෙත දීර්ඝ කාලීනව ගෙවා එමින් පැවති බැවින් එම චක්‍රලේඛයට අනුව රු.35,915 ක් හා රු.22,774 ක් වැය දරා ඇති බව සඳහන් කරන අතර මේ සෑම ගෙවීමක් සඳහාම සභා අනුමැතිය ලබාගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය<br>-----------------<br>2016 දෙසැම්බර් මස 29 දිනැති අංක 30/2016 චක්‍රලේඛය | වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | ඉන්ධන දහනය නියමිත කාලයට පරීක්ෂා කළ යුතු වේ. | ඉන්ධන තුලනය සිදු කරන දිනය තුලදී අත්‍යාවශ්‍ය කටයුතු සඳහා බැහැරට ධාවනය කර තිබූ හෙයින් ඉන්ධන තුලනය සිදු කිරීමට නොහැකි විය. ඉතාම කඩිනමින් ඉන්ධන තුලනය කිරීමට කටයුතු කරමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 55,230,883 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වැරදි නිවැරදි කර නැවත ප්‍රකාශ කරන ලද පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.31,796,470 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,212,665 | 2,893,830 | 2,800,839 | 575,065 | 1,890,800 | 2,357,687 | 2,570,084 | 501,224 |
| කුලී | 7,103,400 | 9,475,836 | 9,449,207 | 3,503 | 6,451,260 | 8,287,310 | 8,238,179 | 75 |
| බලපත්‍ර ගාස්තු | 717,000 | 1,236,478 | 1,236,478 | - | 619,000 | 843,541 | 843,541 | - |
| වෙනත් ආදායම් | 204,492,000 | 177,607,740 | 214,564,157 | 147,859,442 | 158,190,200 | 174,447,606 | 147,922,921 | 185,057,236 |
| එකතුව | 214,525,065 | 191,213,884 | 228,050,681 | 148,438,010 | 167,151,260 | 185,936,144 | 159,574,725 | 185,558,535 |

### 2.2.2 වරිපනම් හා බදු

#### (අ) වරිපනම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.247,320 ක් වූ වරිපනම් බදු ශේෂය තුළ වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන රු.71,600 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති වරිපනම් බදු හිඟ මුදලින් 2020 පළමු කාර්තුව අවසන් වන විට රු.90,578 ක් අයකොට ඇත. |

#### (ආ) අක්කර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.327,745 ක් වූ අක්කර බදු ශේෂය තුළ වර්ෂ 03 ට වැඩි කාලයක සිට පැවත එන රු.301,052 ක් විය. | ප්‍රාදේශීය සභා පනතේ රීති ප්‍රකාරව වසරේ බිල් කිරීම් හා හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති අක්කර බදු හිඟ මුදලින් 2020 පළමු කාර්තුව අවසන් වන විට රු.9,411 අය කොට ඇත. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.13,902,623 ක් හා මුද්දර ගාස්තු රු.121,748,054 ක් විය. ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තුවෙන් රු. 35,821,969 ක් තවදුරටත් අයවීමට තිබුණි. | ලැබිය යුතු මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලැබිය යුතු උසාවි දඩ මුදල්වලින් රු.8,979,980 ක හිඟ මුද්දර ගාස්තු රු.44,801,949 ක මුදලක් 2020 වර්ෂයේ පළමු මාස 04 තුළ ලැබී ඇති අතර ඉතිරි ලැබිය යුතු බදු මුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් උප කාරණා 10 වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවාගෙන තිබූ අතර සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීම මගින් උපකරුණු 42 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | පනවාගත්/ වැළඳගත් අතුරු ව්‍යවස්ථා අනුව කටයුතු කිරීමටත්, සභාවේ අවශ්‍යතාවය පරිදි අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | කුලියාපිටිය ප්‍රාදේශීය සභාව මගින් සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගැනීම මගින් උප කරුණු 42 ක් ආවරණය වන පරිදි අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇති අතර එයට අමතර තවත් උප කරුණු 10ක් ආවරණය වන පරිදි අතුරු ව්‍යවස්ථා පනවා වැළඳගෙන ක්‍රියාත්මක කරන අතර වර්තමානය වනවිට සභා බල ප්‍රදේශයේ ජනනය වන ජෛව ජීරක අපද්‍රව්‍ය ජනන මූලාශ්‍රතුළදීමඅවමකිරීම හා පාලනය සඳහා අතුරු ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරමින් පවතී. |

#### (ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ අය වැය වැඩ සටහන් තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු අනුව පෙල ගස්වා ඉලක්ක, මිනුම් දර්ශක නිශ්චිතව හඳුනාගෙන ප්‍රගතිය මිණුම් කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක 17 කට අදාළව අරමුණු හඳුනාගෙන ඒ අනුව අයවැය ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 අයවැය ලේඛනය සකස් කිරීමේ දී වැඩසටහන් තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු අනුව පෙලගස්වා සකස් කර ඇත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකමින් රු.51,890,292 ක් වසරකට වැඩි වසර 03 ට අඩු කාලයක සිටද, රු.376,652 ක් වසර 03 කට වැඩි කාලයක සිට ද අයවීමකින් තොරව පැවතුණි. | තවදුරටත් ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | 2019.12.31 දිනට අයවිය යුතු මුදලින් ඉතිරි මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වටිනාකමින් රු.2,539,765 ක් වසර එකකට වැඩි වසර 03 කට අඩු කාලයක සිට ද රු.1,188,611 ක් වසර තුනකට වැඩි කාලයක සිටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තෘතියීක කාණ්ඩයට අදාලව එක් පුරප්පාඩුවක් ද, ද්විතීයීක කාණ්ඩයට අදාලව පුරප්පාඩු 13ක් ද, ප්‍රාථමික කාණ්ඩයට අදාලව පුරප්පාඩු 04 ක් හා අතිරික්ත 01 ක් ද පැවතුණි.අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 24 දෙනෙකු සේවා නියුක්ත කරවාගෙන තිබුණි. | අවශ්‍යතා විශ්ලේෂණය අනුව අත්‍යවශ්‍ය බඳවා ගැනීම් පමණක් සිදු කළ යුතු වේ. | අනුමත කාර්ය මණ්ඩලය 146 සහ තත්‍ය කාර්ය මණ්ඩලය 156 එකඟ වේ.අතිරික්ත තනතුර අනුමැත කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.ප්‍රාදේශීය සභාවේ දෛනික කටයුතු පවත්වාගෙනයාමේ දී අත්‍යවශ්‍ය සේවා සඳහා මහ සභා තීරණ මත පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය අනුව අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 24 දෙනෙකු සභාව මඟින් බඳවාගෙන ඇත. |

(ආ) **සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ස්ථාන මාරුවීම, මියයාම, සේවය අතහැරයාම හා විශ්‍රාම යාම හේතුවෙන් නිලධාරීන් 24කගෙන් අයවිය යුතු සේවක ණය ශේෂය රු.1,123,168 ක් විය. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයකර ගැනීමට තොරතුරු සොයා ගැනීමට මාර්ගයක් නොමැති ශේෂ අයකර ගැනීමට ලිපි මඟින් දැනුම් දී ඇත. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කිරිගහපිටිය වත්ත විගණිත අවස්ථාව වනවිට වටිනාකම රු.1,374,500 ක් වූ කැබලි 22ක් අලෙවි කිරීමේ ලැයිස්තුවක් සහිතව අලෙවි කිරීම් කටයුතු ආරම්භ කර තිබුණද සියයට 1ක බදු මුදල් සඳහා අත්තිකාරම් ගෙවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කළ යුතු වේ. | එම සමාගම මඟින් අලෙවි කිරීමේ ලැයිස්තුවක් සකස් කලද ඒ සඳහා ප්‍රාදේශීය සභාව දැනුවත් කර නොමැත. |